---

හලාවත ප්‍රාදේශීය සභාව

පුත්තලම දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 24 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 11 දින සභාවේ සභාපති වරයාට යවා ඇත.

1.2 මතය

---

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව හලාවත ප්‍රාදේශීය සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට හලාවත ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිපල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---

(අ) 2012 වර්ෂය තුල සභාවට ලබාදී තිබූ පොදු ඉඩම් කොටස් 08 ක් සඳහා එම ඔප්පුවලින් දක්වා ඇති වටිනාකම රු.2,825,000 ක් වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ප්‍රධාන ලේකම්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් රු. 1,275,971 ක් අඩුවෙන් ගිණුම්වලදක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 05 කට අදාලව ගිණුම් අනුව ශේෂය රු. 155,880,845 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 156,137,871 ක් විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට වසරක් ඉක්මවා තිබූ ගෙවිය යුතුවූ ගිණුම් ශේෂ 15 ක එකතු වටිනාකම රු. 8, 915,426 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 109,290,083 ක් වූ හිග ආදායම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.40,881,421 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.19,154,173 ක් විය

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපති වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 2,260 | 2,344 | 2,870 |
| (ii) | බදු කුලී | 6,176 | 6,510 | 1,086 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,104 | 3,797 | -- |
| (iv) | වෙනත් ආදායම් | 66,212 | 7,929′ | 113,831 |

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 314 කට අදාලව වසරක් ඉක්මවා තිබූ හිඟ බදු ප්‍රමාණය රු. 1,653,707 ක් විය.

### 2.2.3 බදුකුලී

සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාර ස්ථාන 07 කින් වසරක් ඉක්මවා තිබූ අයවිය යුතු හිඟ මුදල රු.544,060 ක් විය.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 7,018,636 |
| (ආ) | මුද්දර ගාස්තු | 92,422,964 |

2.3 නිශ්ක්‍රීය භෞතික සම්පත්

--------------------------

ප්‍රාදේශීය සභාවට අයත් අංක 43 – 3972 දරන එල්ෆ් වර්ගයේ ලොරි රථය වසර 02 කට වැඩි කාලයක සිට ක්‍රියාවිරහිතව තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) විජී පහන් නඩත්තු උපකරණ, පූර්ව නිකුත් කිරීම් යෙදවීම් හා ඉතිරිය පිළිබඳ අවධානය යොමුකර නැවත නිකුත් කිරීම් සිදුකිරීමේ අභ්‍යන්තර පාලන විධික්‍රමයක් යොදා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල සභාවට සිදුව තිබු පාඩුව රු. 558,818 ක් විය.

(ආ) සභා බල ප්රදේශය තුල අනවසරයෙන් කට්ටි කර විකුණා තිබු අක්කර 13 ක් වු ඉඩම් දෙකකින් පොදු පහසුකම් වෙනුවෙන් වු ඉඩම් කොටස් හා විකුණුම් වටිනාකමින් 1% බැගින් වු බදු මුදල් අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩුව පැවති සභාවේ ලේකම් තනතුර, තාක්ෂණික නිලධාරී තනතුරු 5 ක් සහ ආදායම් පරිපාලන නිලධාරි 03 ක්ද පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාග්ධන වැය විෂයයන් 03 කට අදාලව 2012 වාර්ෂික අයවැය මගින් වෙන්කර තිබු රු.3,800,000 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිකර තිබු අතර, නඩත්තු වැය විෂයයන් 02 කට අදාලව වෙන්කර තිබු රු.3,500,000 ක ප්‍රතිපාදන වලින් රු.480,205 ක් පමණක් වැයකර තිබු අතර, රු.3,019,795 ක් උප යෝජනය කරගෙන නොතිබුණි.

3. පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ගබඩා තොග පාලනය